# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/30 - 2022 ජූලි මස 20 වැනි බදාදා - 2022.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/10/2016/E/366.
*මගේ අංකය* : BD/BD/LND/3/5/45.

ධර්මදූත ජාතික පාසලේ ක්‍රීඩාපිටිය සඳහා ඉඩම් අත්කර ගැනීම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 78B බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කැඳලගම (කොට්ඨාස අංක 4) බදුල්ල මහ නගර සභා ගමේ සර්වේයර් ජනරාල් වෙනුවට බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් 2020.11.23 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක බ 748 දරන පිඹුරෙහි - මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.9181 ඉඩම.

උපලේඛනය 01

**කැබලි අංක 1 - ප්‍රමාණය : හෙක්ටයාර් 0.9181**

ඉඩමේ නම: කොස්කණුව; වර්තමාන ඉඩම් පරිහරණය: කුඹුර (පුරන් වූ); හිමිකම් කියන්නා: අන්දෙනිය පුරාණ විහාරය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා;

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.08.10 වැනි දින පෙ.ව. 10.00ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2022.08.03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2022 ජූලි මස 14 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07- 0115


1A - G 37110 – 14 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*